Australian Government
Department of Home Affairs

# නාවික සංචාරක ප්‍රකාශය

## දළ විශ්ලේෂණය

මුහුදු මාර්ග ඔස්සේ ඕස්ට්‍රේලියාවට පැමිණෙන සංචාරකයෝ නාවික සංචාරක ප්‍රකාශයක් (MTD) ඉදිරිපත් කළ යුතුය. ඔබ ඕස්ට්‍රේලියාවට පැමිණීමට යාත්‍රාව පිටත් වීමට පෙර MTD යොමු කළ යුතු ම ය. ඔබ යාත්‍රාවට ගොඩ වීමට පෙර දින 3 සහ 10 අතර ඔබේ MTD ඉදිරිපත් කළ යුතුය. MTD සම්පූර්ණ කරන විට, ඔබ මේවා කිරීමට අවශ්‍ය වෙයි:

- ඔබ ඕස්ට්‍රේලියාවේ සිටින විට ඉ-තැපැල් ලිපිනයක් සහ සම්බන්ධතා දුරකථන අංකයක් ඇතුළුව ඔබගේ සම්බන්ධතා තොරතුරු සැපයීම
- ඔබේ COVID-19 එන්නත් තත්ත්වය පිළිබඳ ප්‍රකාශයක් සිදුකිරීම
- ඔබ ඕස්ට්‍රේලියාවට පැමිණීමට පෙර පසුගිය දින 14 තුළ ඔබේ ජාත්‍යන්තර සංචාරක ඉතිහාසය පිළිබඳ ප්‍රකාශයක් කිරීම
- ඔබ ගොඩ බසින ප්‍රාන්තයට හෝ දේශභූමියට අදාළ වන නිරෝධායන සහ පරීක්ෂණ අවශ්‍යතා සහ අනුකූල නොවීම සඳහා වන දඬුවම් පිළිබඳව ඔබ දන්නා බවට ප්‍රකාශයක් කිරීම.

**සලකන්න:** ඔබ ඔබේ MTD සම්පූර්ණ කිරීමට පෙර, ඕස්ට්‍රේලියාව සඳහා අනෙකුත් සියලුම සංචාරක අවශ්‍යතා පරීක්ෂා කරන්න. ඔබ සංචාරය කිරීමට පෙර ඔබට අවශ්‍ය සියලුම ලේඛන ලැයිස්තුවක් සඳහා එන්නත් කළ සංචාරකයින් සහ එන්නත් නොකළ සංචාරකයින් සඳහා වන තොරතුරු බලන්න.

මුහුදු මාර්ගයෙන් ඕස්ට්‍රේලියාවට පැමිණෙන සංචාරකයෝ ඩිජිටල් මගී ප්‍රකාශයක් (DPD) ඉදිරිපත් කිරීමට **අවශ්‍ය නොවේ**.

MTD අවශ්‍ය වන්නේ මුහුදු මාර්ගයෙන් ඕස්ට්‍රේලියාවට පැමිණෙන පුද්ගලයින් සඳහා පමණි. ඔබ ගුවන් යානයකින් ඕස්ට්‍රේලියාවට පැමිණෙන්නේ නම්, ඒ වෙනුවට [ඩිජිටල් මගී ප්‍රකාශයක් (DPD)] ඉදිරිපත් කරන්න.

## දඬුවම් සහ බලාත්මක කිරීම

ඔබ ඕස්ට්‍රේලියාවට යන ගමන සඳහා යාත්‍රාවට ගොඩ වීමට පෙර, ඔබේ එන්නත් තත්ත්වය පිළිබඳ ප්‍රකාශයක් ඇතුළුව තීරණාත්මක තොරතුරු සැපයීමට ඔබ සමුද්‍රීය සංචාරක ප්‍රකාශය (MTD) භාවිත කළ යුතුය. මෙය බලාත්මක කළ හැකි අවශ්‍යතාවකි. මෙම අවශ්‍යතාවට අනුකූල වීමට අපොහොසත් වන පුද්ගලයෙකු දඩ ඒකක 30 ක (දැනට $6,660 AUD) සිවිල් දඩයකට (දඩයකට) යටත් විය හැකිය. මෙය *2015 ජෛව ආරක්ෂණ පනතේ* 46 වැනි වගන්තියේ දක්වා ඇත.

**ඕස්ට්‍රේලියානු රජයට අසත්‍ය හෝ නොමඟ යවන සුළු තොරතුරු ලබා දීම බරපතල වරදකි. වරදකරු වුවහොත් උපරිම දඬුවම මාස 12ක සිර දඬුවමකි.**

මහජන සෞඛ්‍ය නියෝගවලට අනුකූලව ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රාන්ත සහ දේශභූමි ද දඬුවම් නියම කළ හැක. මෙයට COVID-19 පරීක්ෂණ සහ ස්වයං හුදෙකලා හෝ නිරෝධායන අවශ්‍යතා ඇතුළත් විය හැකිය. ඔබ ඇතුළු වූ පසු මහජන සෞඛ්‍ය නියෝග හෝ කිසියම් අවශ්‍යතාවයකට ඔබ අනුකූල නොවන්නේ නම්, ඔබට සිරගත කිරීම් හෝ සැලකිය යුතු දඩ මුදල් ඇතුළු බරපතල දඬුවම්වලට මුහුණ දීමට සිදුවේ. අවශ්‍යතා කෙටි දැනුම්දීමෙන් වෙනස් විය හැක. වැඩිදුර තොරතුරු සඳහා [ප්‍රාන්ත සහ දේශභූමිවල ඇතුළු වීමේ අවශ්‍යතා] බලන්න.

පහත කරුණුවලට අදාළ නම් ඕස්ට්‍රේලියාවට පැමිණෙන තාවකාලික වීසා හිමිකරුවන්ගේ වීසා අවලංගු වීම හෝ රදවා ගැනීම සිදු විය හැක:

- ඕස්ට්‍රේලියාවේ දේශසීමා ප්‍රවේශ අවශ්‍යතාවලට අනුකූලව ජාත්‍යන්තර සංචාරක අරමුණු සඳහා සම්පූර්ණයෙන්ම එන්නත් නොකර ඇතිනම්
- ඕස්ට්‍රේලියානු රජය විසින් නිර්වචනය කරන ලද පරිදි COVID-19 එන්නත සඳහා වෛද්‍ය ප්‍රතිවිරෝධතා නොමැති නම්
- නිදහස් කළ අංගයක හෝ තනි සංචාරක නිදහස් කිරීමක් නොමැති නම්.

## ඔබේ ප්‍රකාශය සම්පූර්ණ කිරීම

[MTD මාර්ගගත පෝරමය] භාවිතයෙන් ඔබට ඔබේ සමුද්‍රීය සංචාරක ප්‍රකාශය (MTD) සම්පූර්ණ කළ හැක.

ඔබට ගිණුමක් සෑදීමට අවශ්‍ය වෙයි, එමඟින් ඔබගේ වර්තමාන සහ අනාගත ප්‍රකාශයන් එක තැනක කළමනාකරණය කිරීමට ඔබට ඉඩ සලසයි.

# ඔබේ ප්‍රකාශය ආරම්භ කිරීම

ඔබ MTD සඳහා ගෙවිය යුතු නැත – එය නොමිලේ සිදු කෙරේ.

ඔබ ඔබේ ප්‍රකාශය ආරම්භ කිරීමට පෙර, පහත තොරතුරු සූදානම් කර ගන්න:

- යාත්‍රාවේ නම සහ වර්ගය
- පිටත්වන සහ පැමිණෙන වරායවල්
- වලංගු ගමන් බලපත්‍රයක්
- ඔබ ඕස්ට්‍රේලියාවට පැමිණීමට පෙර දින 14 තුළ ජාත්‍යන්තර සංචාර
- COVID-19 එන්නත් කිරීමේ වාර්තාව හෝ වෛද්‍ය හේතු මත ඔබට එන්නත් කළ නොහැකිබවට පිළිගත හැකි සාධක.

සෑම වැඩිහිටියෙකුම තමන්ගේ ම ප්රකාශය සම්පූර්ණ කළ යුතුය. දෙමාපියන් වයස අවුරුදු 15 ට අඩු ඕනෑම දරුවෙකු සඳහා ප්‍රකාශයක් සම්පූර්ණ කළ යුතුය. ඔබට මුද්‍රණ කළ හැකි හෝ බා ගත හැකිව ඔබ සම්පූර්ණ කළ ප්‍රකාශය සහිත ඉ-තැපෑලක් ලැබෙයි.

## වට චාරිකා යාත්‍රා

ඕස්ට්‍රේලියාවේ වට චාරිකා යාත්‍රාවක් ආරම්භ වී අවසන් වන විට, සංචාරකයෝ සහ කාර්ය මණ්ඩලය ඔවුන් ගමන ආරම්භයේදී යාත්‍රාවට සම්බන්ධ වූයේ නම් නාවික ගමන් ප්‍රකාශයක් (MTD) සම්පූර්ණ කිරීමට අවශ්‍ය නොවේ. මෙයට දේශීය යාත්‍රා සහ ඕස්ට්‍රේලියාවේ ආරම්භ කර අවසන් වන ජාත්‍යන්තර මුහුදු ගමන් ඇතුළත් වේ.

ඔබ විදේශ වරායක වට චාරිකාවකට සම්බන්ධ වන්නේ නම්, ඔබ ගමනට සම්බන්ධ වීමට පෙර MTD සම්පූර්ණ කළ යුතුය.

## නාවික කාර්ය මණ්ඩලයට තොරතුරු

නෞකාවක සේවය කරන සමුද්‍රීය කාර්ය මණ්ඩලය ඕස්ට්‍රේලියාවට යාත්‍රාවට ගොඩ වීමට පෙර සමුද්‍ර සංචාරක ප්‍රකාශයක් (MTD) සම්පූර්ණ කළ යුතුය. ඕස්ට්‍රේලියාව බලා යන ගමනේදී ඔබේ යාත්‍රාව නැවතුම් කිහිපයක් සිදු කරන්නේ නම්, MTD එකක් සම්පූර්ණ කළ යුත්තේ ඔබේ පළමු පිට වීමේ වරායට පෙර පමණි.

යාත්‍රාව භාරව සිටින පුද්ගලයා හෝ යාත්‍රාවේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙකු මුහුදු ගමනේදී මගීන් සමග අන්තර් ක්‍රියා නොකරන්නේ නම් සහ ඕස්ට්‍රේලියානු භූමියේ සිටියදී යාත්‍රාවෙන් බැසීමට අදහස් නොකරන්නේ නම් MTD එකක් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.

වාණිජ යාත්‍රාවල සමුද්‍රීය කාර්ය මණ්ඩලය MTD සම්පූර්ණ කිරීම අවශ්‍ය නොවේ. වාණිජ නැව් යාත්‍රාවක සිටින ඕනෑම මගියෙකු MTD සම්පූර්ණ කිරීම අවශ්‍ය වේ.

ඕස්ට්‍රේලියාවේ දේශීයව ක්‍රියාත්මක වන යාත්‍රා සඳහා MTD සම්පූර්ණ කිරීම අවශ්‍ය නොවේ.

ඔවුන්ගේ නෞකාවට සම්බන්ධ වීමට **ගුවන් යානයෙන්** ඕස්ට්‍රේලියාවට පැමිණෙන සියලුම නාවික කාර්ය මණ්ඩලය MTD නොව ඩිජිටල් මගී ප්‍රකාශය (DPD) සම්පූර්ණ කළ යුතුය. මෙයට හේතුව MTD සලකනුයේ මුහුදු මාර්ගයෙන් ඕස්ට්‍රේලියාවට පැමිණෙන පුද්ගලයින් සඳහා පමණක් වීමයි

## ඔබේ නාවික සංචාරක ප්‍රකාශනයේ ප්‍රතිඵලය

සම්පූර්ණ කරන ලද සමුද්‍රීය සංචාරක ප්‍රකාශයක් (MTD) ඔබ ඕස්ට්‍රේලියාවට ඇතුළු වීම සහතික නොකරයි.

ඔබ MTD ඉදිරිපත් කළ පසු, ඔබේ යාත්‍රාවට ගොඩ වීමට පෙර සහ ඕස්ට්‍රේලියාවට පැමිණීමට පෙර (මුද්‍රිත හෝ ඉලෙක්ට්‍රොනික වශයෙන්) පෙන්විය යුතු ඉ-තැපැලක් ඔබට ලැබෙයි. ඔබට ඔබේ MTD ගිණුමේ ප්‍රතිඵලයට ද ප්‍රවේශ විය හැක.

ඔබ යාත්‍රා කිරීමට පෙර යාත්‍රා ක්‍රියාකරුවෝ ඔබේ MTD ප්‍රතිඵලය සමාලෝචන කරති. ඔබේ MTD පහත ප්‍රතිඵලයක් පෙන්වයි:

- **කොළ:** ඔබ ඔබේ ප්රකාශනයේ ඇතුළත් කර ඇති තොරතුරුවලින් පෙන්නුම් කරන්නේ ඔබ ඕස්ට්රේලියාවට ඇතුළු වීමට ඕස්ට්රේලියාවේ එන්නත් අවශ්යතා සපුරා ඇති බවයි. ඇතුල්වීමේදී ඔබට තවමත් ඔබේ ලේඛන පෙන්වීමට අවශ්‍ය වෙයි. යාත්රා ක්රියාකරුවෝ ඔබට යාත්රාවට ගොඩවීමට ඉඩ දීමේ අවසාන තීරණය ගනිති.
- **නිල්:** ඔබ ඔබේ ප්රකාශයේ ඇතුළත් කර ඇති තොරතුරුවලින් පෙන්නුම් කරන්නේ ඔබේ තත්වය අනුව ඔබට ඕස්ට්රේලියාවට ඇතුළු වීමට ඕස්ට්රේලියාවේ එන්නත් අවශ්යතා සපුරාලිය හැකි බවයි. ඔබ ගොඩ වීමට පෙර යාත්රා ක්රියාකරුට අමතර පරීක්ෂා කිරීම් කිහිපයක් කිරීමට අවශ්‍ය විය හැක.
- **රතු:** ඔබ ඔබේ ප්රකාශනයේ ඇතුළත් කර ඇති තොරතුරුවලින් පෙන්නුම් කරන්නේ ඔබ ජාත්යන්තර සංචාර සඳහා ඕස්ට්රේලියාවේ එන්නත් අවශ්යතා සපුරා නොමැති බවයි. ඔබට සංචාරක සීමාවලින් නිදහස් කිරීමක් නොමැති නම් ඔබට ඕස්ට්රේලියාවට ඇතුළු විය නොහැක. ඔබට යාත්රාවට ගොඩවිය හැකිද යන්න පරික්ෂා කිරීමට ඔබේ යාත්රා ක්රියාකරුට අමතර පරීක්ෂාවන් කිහිපයක් කිරීමට සිදු විය හැක.

ඔබ ගමන් කිරීමට හෝ සංක්‍රමණය කිරීමට අදහස් කරන සියලුම ප්‍රාන්ත සහ දේශභූමි සඳහා සංචාර සහ නිරෝධායන විධිවිධාන ඔබ පරීක්ෂා කළ යුතුය. සෑම ඕස්ට්‍රේලියානු ප්‍රාන්තයේ ම සහ දේශභූමියේ ම අවශ්‍යතා වෙනස් වේ. වැඩිදුර තොරතුරු සඳහා ප්‍රාන්ත සහ දේශභූමිවල ඇතුළු වීමේ අවශ්‍යතා බලන්න.

## යාත්රා ක්රියාකරුවෝ සඳහා වන වැඩි විස්තර

මගී නැව් ක්‍රියාකරුවන්, වාණිජ යාත්‍රා, සුපිරි යාත්‍රා, යාත්‍රා සහ විනෝද යාත්‍රා ඇතුළු යාත්‍රා ක්‍රියාකරුවන් සඳහා, දැනුවත් විය යුතු අමතර අවශ්‍යතා තිබේ. බලන්න මුහුදු මාර්ග ඔස්සේ ඇතුල්වීම හා පිටවීම.

## සහය

ඔබට MTD සම්පූර්ණ කිරීමට සහය අවශ්‍ය නම්, නිති අසන පැන බලන්න.